[ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2040/46 – 2017 ඔක්තෝබර් 13 වැනි සිකුරාදා – 2017.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ දකුණ උඩ පත්තුව සුළු කොට්ඨාසයේ, තැඹිලියන (අ.ග.පි. 226) ගමේ පිහිටි රත්නපුර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක R/KRW/2014/130 හා 2014.04.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.5912 ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – පැරඩයිස් වත්ත – ප්‍රමාණය: හෙක්. 1.5912

උතුරට: මාර්ගය සහ මහදෙනිය; නැගෙනහිරට: මහදෙනිය සහ මාර්ගය (ප්‍රා. ස.); දකුණට: මාර්ගය (ප්‍රා. ස.); බටහිරට: මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය : 4-3/4/2013/D/642.
2017 අගෝස්තු මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 1671

1A – G26425 – 12 (2017/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*